# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය - හෝමාගම.

## පළමු වාර පරීක්ෂණය - 2011

## ඉතිහාසය

**6 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- ❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ඉතිහාසයේ පියා ලෙස සැලකෙනුයේ

i).ඩියඩෝටරස් ii).හෙරඩෝටස් iii).පොලිබියස් iv).ඊ.එච්.කාර්

2. ඉතිහාසය යනු අතීතය සහ වර්තමානය අතර නොනවතින සංවාදයකි.මෙසේ ප්‍රකාශ කළේ

i).ඊ.නියාර් ii).වීල් ඩුරන්ට් iii).ඊ.එච්.කාර් iv).හෙරඩෝටස්

3.මිහිපිට ජීවීන් අතර අපූර්වතම සත්වයා වන්නේ

i).දෙවියන්ය ii).මිනිසුන්ය iii).සතුන්ය iv).බ්‍රාහ්මණයන්ය

4. අප හට අතීත තොරතුරු සොයාගත හැකි වන්නේ

i).මූලාශ්‍ර මගින් ii).ගුවන් විදුලියෙන් iii).ඇඳුම් පැළඳුම් මගින් iv).කටකතා මගින්

5. ඉතිහාසගත තොරතුරු සත්‍ය ඒවා ලෙස පිළිගන්නේ

i).එම තොරතුරු මූලාශ්‍ර මගින් සනාථ වන්නේ නම් පමණි

ii). එම තොරතුරු කවුරුන් හෝ ප්‍රකාශ කළ නිසාය.

iii).කට කථා මගින් ප්‍රකාශ කළ නිසාය.

iv).රූපවාහිනිය මගින් ප්‍රකාශ කළ නිසාය.

6.මිහිමත බිහිවූ පැරණිතම මිනිසා දියුණු ශිෂ්ටාචාරයක් කරා යන ගමනේදී ප්‍රධාන අවධි

i).දෙකක් පසුකර ඇත. ii).තුනක් පසුකර ඇත. iii).හතරක් පසුකර ඇත. iv).එකක් පසුකර ඇත.

7.ශිෂ්ටාචාර බිහිවීමේ නිවැරදි පිළිවෙල වන්නේ

i).දඩයම්"එඬේර"ගොවි යුගය ii).එඬේර"දඩයම්"ගොවි යුගය

iii).ගොවි" එඬේර" දඩයම් යුගය iv). ගොවි" දඩයම්" එඬේර යුගය

8.ගල්ගුහා"ගස් බෙන"ගස් රුප්පා නිවාස ලෙස භාවිතා කළ යුගය වන්නේ

i). දඩයම් යුගය ii). ගොවි යුගය iii). එඬේර යුගය iv).නවීන යුගය

9. මිනිස් ශිෂ්ටාචාරයේ ආදිතම (පැරණි) යුගය වන්නේ

i). එඬේර යුගය ii). ගොවි යුගය iii). ශිලා යුගය iv). දඩයම් යුගය

10. දඩයම් යුගයේ ලොකුම ජයග්‍රහණය වන්නේ

i). ගින්දර සොයාගැනීම ii).නිවාස සොයා ගැනීම iii). සතුන් ඇති කිරීම iv). වගා කිරීම

11. ආදි මානවයා සතුන් හීලෑකිරීමට යොමු වූ අවධිය වන්නේ

i). දඩයම් යුගය ii). එඬේර යුගය iii). ගොවි යුගය iv). තාක්ෂණික යුගය

12. ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය ලෙස සැලකූ යුගය වන්නේ

i). ගොවි යුගය ii). දඩයම් යුගය iii). එඬේර යුගය iv). මේ සියළුම යුගයන්ය

13. ස්ථිර නිවාස භාවිතය ආරම්භ වූයේ

i). ගොවි යුගයේදී ii). දඩයම් යුගයේදී iii). එඬේර යුගයේදී iv). ශිලා යුගයේදී

14. අපගේ මූලික අවශ්‍යතා වන්නේ

i). ආහාර"ඇඳුම්"නිවාස ii). මුදල්"යානවාහන"අධ්‍යාපනය

iii). ආහාර"පොත්පත්" අධ්‍යාපනය iv). ඇඳුම්"නිවාස"ඉඩකඩම්

15. රෝදය"අත්කරත්ත වැනි උපකරණ භාවිත කළ යුගය වන්නේ

i). දඩයම් යුගය ii). ගොවි යුගය iii). එඬේර යුගය iv). ශිලා යුගය

16. විජය කුමරු ලංකාවට පැමිණියේ

i). ඇමෙරිකාවේ සිට iii). ලාට දේශයේ සිට iii). දකුණු ඉන්දියාවේ සිට iv). මැද පෙරදිග සිට

17. විජය කුමරු සමග රටින් පිටුවහල් කළ පිරිස කොපමණද?

i). අටසියයකි ii). හත්සියයකි iii). පන්සියයකි iv). දෙසියකි

18. විජය කුමරු ලංකාවට ගොඩබට ස්ථානය වන්නේ

i). තම්මැන්නාව(තම්බපන්නි) ii). මහාතිත්ථ iii). මහියංගණය iv). දීඝවාපිය

19. විජය ඇතුළු පිරිස ලක්දිවට පැමිණෙන අවධියේ මෙරට සිටි ජන කොටස් වන්නේ

i). යක්ෂ හා නාග ගෝත්‍රිකයන්ය ii). දේව ගෝත්‍රිකයන්ය

iii). බ්‍රාහ්මණයන්ය iv). කිසිවෙක් සිටියේ නැත

20. කුවේණිය යනු

i). යක්ෂ ගෝත්‍රික කාන්තාවකි ii). නාග ගෝත්‍රික කාන්තාවකි

iii). දේව ගෝත්‍රික කාන්තාවකි iv). බ්‍රාහ්මණ ගෝත්‍රික කාන්තාවකි

## II කොටස

### ප්‍රශ්ණා සියල්ලටම පිළිතුරු සපයන්නග

දී ඇති ජේදය කියවා අසා ඇති ප්‍රශ්ණා වලට කෙටි පිළිතුරු සපයන්න.

01. ඉතිහාසය යනු මිනිස් වර්ගයා සිය පැවැත්ම උදෙසා ආරම්භයේ සිට වර්තමානය දක්වා හැඩ ගස්සවා ගත් දේශපාලනික"සමාජ"ආර්ථික" ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම් වල තුලනාත්මකව අධ්‍යනය කිරීමයි.

- I. මිනිස් වර්ගයා යනු කවුරුන්ද?
- II. පැවැත්ම යනු කුමක්ද?
- III. ආරම්භයේ සිට වර්තමානය යනු කුමක්ද?
- IV. සමාජය සකස් වී ඇත්තේ කවුරුන්ගෙන්ද?
- V. දේශපාලනය යනු කුමක්ද?

02.

- I. ඉතිහාසය පිළිබඳව පොලිබියස් හෝ ඩියඩෝරස් හෝ ඊ.එච්.කාර් සිදුකර ඇති නිර්වචන හයක් ලියන්න.
- II. ඉතිහාසය ඉගෙනීමේ ඇති ප්‍රයෝජන 03 ක් ලියන්න.

03. පහත වගුව පුරවන්න.

| යුගය | ඇදහිලි හා විශ්වාස |
|---|---|
| දඩයම් යුගය | |
| එඬේර යුගය | |
| ගොවි යුගය | |

04.

- I. විජය කුමාරයාගේ මවුපියන්ගේ නම් ලියන්න.
- II. විජය ඇතුළු පිරිස රටින් පිටුවහල් කිරීමට හේතු වූ කරුණ කුමක්ද?
- III. විජය කුමාරයාගේ පියා රජකම් කළේ කුමන රටේද?
- IV. විජයගේ මුත්තනුවන් වූයේ කවුරුන්ද?
- V. විජයගේ මුත්තනුවන් රජකම් කළේ කුමන රටේද?